# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 21 දරන විදුලිසංදේශ බදු පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 අප්‍රේල් මස 01 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 4.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2011 අංක 21 දරන විදුලිසංදේශ බදු පනත

[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 8/2011.

**2011 ජනවාරි මස 1 වන දින සිට ආරම්භ වන පරිදි යම් විදුලිසංදේශ සේවාවක් ලබා ගන්නා තැනැත්තන් මත විදුලිසංදේශ බද්දක් පැනවීම සඳහා ද; 2004 අංක 11 දරන මුදල් පනතේ II වන කොටස සංශෝධනය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 2011 අංක 21 දරන විදුලිසංදේශ බදු පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය සියලු කාර්ය සඳහා 2011 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

## I වන කොටස

## විදුලිසංදේශ බද්ද

විදුලිසංදේශ බද්ද පැනවීම.

2. 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන කාලය සඳහා (මෙහි මින්මතු "ග්‍රාහකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් විදුලිසංදේශ සේවාවක් ග්‍රහණය කරන සෑම තැනැත්තෙකුගෙන් ම එක් එක් මාසය සම්බන්ධයෙන් ක්‍රියාකරු විසින් සපයන ලද විදුලිසංදේශ සේවා සැපයුමේ අගය මත ගණින් බලන ලද මුදලින් සියයට විස්සක් වූ විදුලිසංදේශ බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් පනවා අය කර ගනු ලැබිය යුතු ය :

එසේ වුව ද, 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන කිසිම සංවිධානයක් හෝ පුද්ගලයකු විසින් ඉහත සඳහන් බද්ද ගෙවීම අවශ්‍ය නොවන්නේ ය.

බදු එකතු කිරීමේ ක්‍රමය.

3. 2 වන වගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලිසංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රලත් ක්‍රියාකරුවන් විසින් එකතු කර, (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා විදුලිසංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි

යම් විස්තර ද සමඟ 2011 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන එක් එක් මාසය අවසානයේ පටන් දින පහළොවක් ඇතුළත, ඉහත කී පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

ආණ්ඩුව වෙනුවෙන්, කොමිෂන් සභාව විසින් බදු එකතු කළ යුතු බව.

**4.** කොමිෂන් සභාව විසින් 2 වන වගන්තිය ප්‍රකාර එක් එක් මාසය සම්බන්ධයෙන් ආණ්ඩුව වෙනුවෙන් එකතු කරන ලද බද්ද, 3 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, බද්ද ලැබීමෙන් දින හතක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

භාණ්ඩාගාර ලේකම් විසින් මාර්ගෝපදේශ නිකුත් කළ යුතු බව.

**5.** භාණ්ඩාගාර ලේකම් විසින්, ආණ්ඩුව වෙනුවෙන් බද්ද එකතු කිරීම හා ප්‍රේෂණය කිරීමට අදාළ මාර්ගෝපදේශ, කලින් කල නිකුත් කරනු ලැබිය යුතු ය.

බද්ද ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවල දී ගත යුතු ක්‍රියාමාර්ග.

**6.** (1) 2 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, සේවා සැපයුමේ වටිනාකම මත අයවිය යුතු මුළු බදු ප්‍රමාණය ගෙවීම පැහැර හරින යම් බලපත්‍රලත් ක්‍රියාකරුවකු පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පැහැර හරින්නා සංස්ථාගත මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා, යම් අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන නිලධරයා, මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද, අයවිය යුතු දින හෝ ඊට පෙර නොගෙවා පැහැර හරිනු ලැබූ බද්දක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) පැහැර හරින්නා විසින්, පැහැර හරින ලද බද්දට අමතරව,

(අ) 2 වන වගන්තිය යටතේ බද්ද ගෙවීමට නියමිත දින පටන් එක් මාසයකට හෝ ඉන් කොටසකට පසු කාලසීමාව සඳහා අයවිය යුතු පැහැර හරින ලද බදු මුදලින් සියයට දහය බැගින් ; සහ

(ආ) (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති බද්ද ගෙවීමට නියමිත දින පටන් එක් මාසයකට හෝ ඉන් යම් කොටසකට පසු කාලසීමාව සඳහා අයවිය යුතු පැහැර හරින ලද බදු මුදලින් සියයට දෙක බැගින්,

ගණන් බලනු ලබන අධිභාරයක් ගෙවීමට ද යටත් විය යුතු අතර, ඒ අධිභාරය කොමිෂන් සභාව විසින් එකතු කරනු ලැබිය යුතු ය.

(3) මාස තුනකට වැඩි කාලසීමාවක් පැහැර හැර ඇති යම් බද්දක්, ඒ මත එකතු වූ අධිභාර මුදල ද සමඟ මෙහි මින්මතු සඳහන් කරනු ලැබ ඇති ආකාරයට අය කර ගැනීම සඳහා කොමිෂන් සභාව කටයුතු කළ යුතු ය.

(4) පැහැර හැර ඇති බද්ද, ඒ මත එකතු වූ අධිභාර මුදල ද සමඟ අය කර ගැනීමට පියවර කිසිවක් ගැනීමට සති තුනකට පෙරාතුව, මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර, පැහැර ඇති බදු මුදල සහ ඒ මත එකතු වූ අධිභාරය අය කර ගැනීම සඳහා නීති කෘත්‍ය ආරම්භ කිරීමට අදහස් කරන බව දැනුම් දෙමින් කොමිෂන් සභාව විසින් පැහැර හරින්නා වෙත දැන්වීමක් නිකුත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය ප්‍රකාර, පැහැර හරින්නා වෙත දැන්වීමක් නිකුත් කරනු ලැබ, ඒ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති සති තුනක කාලසීමාව ඉකුත් වී ඇති නමුත්, අධිභාරය සමඟ පැහැර හැර ඇති මුදල නොගෙවනු ලැබ ඇති අවස්ථාවක, පැහැර හරින්නා වාසය කරන්නා වූ හෝ ව්‍යාපාරය කර ගෙන යන්නා වූ කොට්ඨාසය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇත්තා වූ මහෙස්ත්‍රාත්වරයා වෙත, පැහැර හරින්නාගේ නම හා ලිපිනය සහ පැහැර හැර ඇති මුළු මුදල ඇතුළත් සහතිකයක්, මේ වගන්තිය මඟින් නියමිත ගෙවීම කිරීම, එසේ නම් කරන ලද තැනැත්තා විසින් පැහැර හැර ඇති බවට වූ ප්‍රකාශයක් ද සමඟ, කොමිෂන් සභාව විසින් සභාපතිගේ අත්සන යටතේ නිකුත් කරනු ලැබිය යුතු ය. පැහැර හරින්නා සංස්ථාගත මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලයේ සභාපතිගේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ හා සෑම අධ්‍යක්ෂවරයකුගේ ම නම් සහතිකයේ ඇතුළත් විය යුතු ය.

(6) මහෙස්ත්‍රාත්වරයා විසින්, (5) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකය ලැබුණ විට නියම කරනු ලැබිය යුතු යම් දිනයක තමා ඉදිරියේ පෙනී සිට, පැහැර හරින ලද බදු මුදල, ඒ මත එකතු වූ අධිභාරය ද සමඟ අය කර ගැනීම සඳහා පැහැර හරින්නාට විරුද්ධව නීති කෘත්‍ය ආරම්භ නොකළ යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙසට නියම කරමින්, මහෙස්ත්‍රාත්වරයා විසින් පැහැර හරින්නා වෙත සිතාසි නිකුත් කරනු ලැබිය යුතු ය. දක්වන ලද හේතුව, නොගෙවීම සඳහා වූ හේතුව පැහැදිලි කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ යයි මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ බව සටහන් කර ගැනීමෙන් පසුව, පැහැර හරින ලද බදු මුදල, ඒ මත එකතු වූ අධිභාරය ද සමඟ

මහෙස්ත්‍රාත්වරයා විසින් පනවන ලද දඩයක් සේ සලකා, පැහැර හරින්නාගෙන් අය කර ගැනීම සඳහා ආඥා කරනු ලැබිය යුතු ය. එසේ අය කර ගනු ලැබූ මුදල් කොමිෂන් සභාව වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින් එකී මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

II වන කොටස

**2004 අංක 11 දරන මුදල් පනතේ II වන කොටස සංශෝධනය කිරීම**

2004 අංක 11 දරන මුදල් පනතේ II වන කොටස සංශෝධනය කිරීම.

**7.** 2004 අංක 11 දරන මුදල් පනතේ II වන කොටසේ 14 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "2008 පෙබරවාරි මස 29 වන දිනයෙන් අවසන් වන කාලය සඳහා" යන වචන වෙනුවට "2008 පෙබරවාරි මස 29 වන දින ආරම්භ වී 2010 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලය සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

2004 අංක 11 දරන මුදල් පනතේ II වන කොටස අදාළ නොවිය යුතු බව.

**8.** 2004 අංක 11 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන 2011 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව අදාළ වූ යම් තැනැත්තකුට එකී කොටසේ විධිවිධාන අදාළ නොවිය යුතු බවට සැක දුරු කිරීමේ කාර්යය සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

III වන කොටස

**සාමාන්‍ය**

නියෝග.

**9.** (1) නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති හෝ නියෝග සෑදිය යුතු යයි මේ පනතින් නියමිත යම් කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනත මගින් නියම කිරීම අවශ්‍ය වන්නා වූ කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය ; නැතහොත් එහි නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම හැකි පහසු ඉක්මනින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම්

නියෝගයක් එම අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ ඊට කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් (3) වන උපවගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

**10.** 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලය ඇතුළත යම් ග්‍රාහකයකුගෙන් යම් ක්‍රියාකරුවකු විසින් අය කර එකතු කර ගන්නා ලද බදු මුදල වලංගු ලෙස පනවා අය කර ගත් බවට සලකනු ලැබිය යුතු අතර, එම බද්ද අය කිරීම සම්බන්ධයෙන් එම ක්‍රියාකරු යම් සිවිල් හෝ අපරාධ නඩුවකින් මෙයින් හානිපූරණය කරනු ලැබේ. හානිපූරණය.

**11.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12.** මේ පනතේ I කොටසේ කාර්ය සඳහා— අර්ථනිරූපණ.

"සැපයුමේ අගය" යන්නෙන්, මේ පනතේ විධිවිධාන යටතේ අය කළ හැකි බද්ද අඩු කිරීමෙන් පසු සේවයේ දළ විටිනාකම අදහස් වේ ;

"විදුලිසංදේශ සේවාව" යන්නෙන්, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලිසංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍ර ලැබූ විදුලිසංදේශ හා වෙනත් ක්‍රියාකරුවන් විසින් අවසාන ග්‍රාහකයන්ට සපයනු ලබන සේවා අදහස් වන නමුත් 2004 අංක 11 දරන මුදල් පනතේ III වන කොටසේ 21 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ආවරණය වූ දේශීය ක්‍රියාකරුවන් ජාත්‍යන්තර සංවිධාන අතර සලසනු ලබන සහ දේශීය ක්‍රියාකරුවන් සහ විදේශීය විදුලිසංදේශ සමාගම් අතර සහ දේශීය ක්‍රියාකරුවන් සහ විදේශීය විදුලිසංදේශ සේවා සපයන්නන් අතර සහ ජාත්‍යන්තර විදුලිසංදේශ සේවා අතර ඇති කර ගත් අන්තර් සම්බන්ධතා සේවාවන් සහ ප්‍රවේශ සේවාවන් ඇතුළත් නොවේ.

"අන්තර් සම්බන්ධතා සේවා" යන්නෙන්, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලිසංදේශ පනතේ 68 වන වගන්තිය යටතේ සාදන ලද 2003 අන්තර් සම්බන්ධතා රීතිවල සඳහන් අන්තර් සම්බන්ධතා සේවා අදහස් වේ.

"ප්‍රවේශ සේවා" යන්නෙන්, දේශීය හෝ ජාත්‍යන්තර ලීස් ලයින් සේවා, බැකෝල් සේවා සහ යටිතල පහසුකම් සේවා අදහස් වේ.

"ක්‍රියාකරු" යන්නෙන්, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලිසංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍ර ලැබූ ක්‍රියාකරුවකු අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.